බේරුවල නගර සභාව
කළුතර දිස්ත්‍රික්කය
---------------------------------

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 05 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට බේරුවල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2012 වර්ෂයේ පොත් සමීක්ෂණයේදී හඳුනාගත් ඌණ පොත් වල වටිනාකම ගිණුම්වලින් ඉවත් කිරීමේදී ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුම හරකර පුස්තකාල පොත් ගිණුම බැරකළ යුතු වුවත් පොත් ඉවත්කිරිමේ ගිණුම හරකර පුස්තකාල පොත් ගිණුම බැරකිරීම හේතුවෙන් ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.46,906 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පුස්තකාලයෙන් ලද ශේෂ සනාථ කිරීම් අනුව සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් පරිත්‍යාග රු.99,300 ක් වුවත් රු.60,320 ක් ලෙස ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් පුස්තකාල පොත් හා පරිත්‍යාග රු.38,980 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ රු.229,518 ක් වටිනා පුස්තකාල පොත් මිලදී ගැනීමේදී ඒ සඳහා ලද වට්ටම වූ රු.46,546 සඳහා ද පොත් ලැබී තිබූ බැවින් මුළු වටිනාකම ලෙස රු.276,064 ක් ප්‍රාග්ධනිත කළ යුතු වුවත් රු.229,518 ක් පමණක් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඈ) 2016 වර්ෂයට අදාළව 2017 වර්ෂයේ සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණය අනුව ඉවත්කරන ලද භාණ්ඩවල වටිනාකම ලෙජර් ගිණුම් වලින් ඉවත් කර නොතිබුණි.

1.3.2 **<u>නොසැසඳුණු ගිණුම්</u>**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.31,816,754 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.3,301,849 ක නොසැසඳීම් නිරීක්ෂණය විය.

1:3:3 **<u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>**

ස්ථාවර වත්කම් ලේඛනය හා උපලේඛන නොමැතිවීම නිසා එකතුව රු.88,048,105 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) මුදල්රෙගුලාසි 371(2)(ඇ) | 1,276,043 | නිශ්චිත කාර්යයක් සඳහා දෙන ලද අත්තිකාරම් මුදලක් අදාළ කාර්යය නිම වූ විගසම පිය විය යුතු වුවත් එසේ පියවා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | 2,129,151 | කල් ඉකුත් වූ තැන්පතු ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1647(ආ) | | සභාව සතුව පවතින වාහන හා ඒවායේ උපකරණ පිළිබඳව සම්පූර්ණ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය | | පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත්කිරිමේ ක්‍රියාපරිපාටිය ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන හඳුනාගෙන බලපත්‍ර ලබාදීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) 2017 නොවැම්බර් 13 දිනැති අංක 1941 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | | 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල පනතේ කාර්යයන් සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර පිළිගෙන ඇති හෝටලයක් ආපන ශාලාවක්, නවාතැන් පළක් වන විටදී ඊට අදාළ බලපත්‍ර ලබා දීමේදී එම පරිශ්‍රයේ ලැබීම් වලින් සියයට එක දක්වා බලපත්‍ර ගාස්තුවක් අයකළ යුතු වුවත් සංචාරක මණ්ඩලයේ අනුමත කරන ලද හෝටල් තුනකින් එකී ගාස්තු අයකර නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2:1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.32,574,806 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.42,076,220 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2:2:1 ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර්31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 15,267,400 | 15,289,634 | 14,821,687 | 18,372,695 | 15,267,168 | 15,267,168 | 21,035,937 | 17,904,747 |
| (ii) කුලී | 7,457,200 | 7,457,175 | 6,725,425 | 1,502,150 | 7,457,175 | 7,457,175 | 8,582,075 | 809,100 |
| (iii) බලපත්‍ර ගාස්තු | 160,000 | 192,750 | 170,000 | 22,750 | 129,750 | 129,750 | 121,750 | 8,000 |
| (iv)වෙනත් ආදායම් | 14,680,800 | 7,528,914 | 7,376,584 | 240,043 | 17,481,063 | 17,428,083 | 17,337,632 | 143,433 |

2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂය ආරම්භයට සභාවේ සමස්ථ හිඟ ආදායම රු.18,865,280 ක් වූ අතර වර්ෂයට අදාල බිල් කිරීම් රු.30,468,473 ක් විය. වර්ෂය තුළ ලැබීම් කපාහැරීම් හා ගැලපුම් රු. 29,196,115 ක් වූ අතර සමස්ථ ආදායම් හිඟය රු.20,137,638 ක් විය.

2.2.3 **වරිපනම් හා බදු**

**වරිපනම්**

(අ) 2017 ජනවාරි 01 දිනට සභාවේ හිඟ වරිපනම් බදු ශේෂය රු.17,904,747 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී ඉන් රු.7,596,975 ක් හෙවත් සියයට 42 ක් පමණක් අයකර ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බිල් කිරීම රු.15,289,633 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.7,224,710 ක් හෙවත් සියයට 47 ක් පමණක් අයකරගෙන තිබුණි.

(ඇ) හිඟ වරිපනම් අයකිරීම හා ප්‍රවර්තන වර්ෂයට අදාළව වරිපනම් අයකිරීම සියයට 50 කට වඩා අඩු අගයක් ගෙන තිබුණු අතර සමස්ථ අයකිරීමේ ප්‍රගතිය සියයට 45 ක් විය.

2.2.4 බලපත්‍ර ගාස්තු

2010 සිට 2016 වර්ෂය දක්වා බදු පැහැරහැර ඇති ව්‍යාපාරිකයින් 155 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.244,935 ක මුදලක් වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණි.

2.2.5 වෙනත් ආදායම්

සභා බල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ ගාල් කරන ස්ථාන පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණ අතර, සුපිරි වෙළඳපොල ඉදිරිපිට නවතා ඇති ත්‍රීරෝද රථ 43 කින් 2017 දෙසැම්බර් 31 දිනට හිඟව තිබූ ගාස්තු රු.251,652 න් රු.32,000 ක් 2018 සැප්තැම්බර් 03 දින වන විටද හිඟව පැවතුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.193,450 ක් හා මුද්දර ගාස්තු රු.15,933,198 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3:1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරිම, ජනතාවගේ සුබ විහරණය, පහසුව සහ සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරිම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

නගර සභා ආඥා පනතේ 157 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විට එක් කාරණාවක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත කර්මාන්ත කිසිවක් ඇතුළත් කර නොතිබූ අතර ඉටුකිරීමට අපේක්ෂිත කර්මාන්ත වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කර තිබුණි. ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර තිබූ කර්මාන්ත 09 ක් වර්ෂය තුළ ඉටුකර නොතිබූ අතර සැලැස්මට පරිභාහිරව ව්‍යාපෘති 20 ක් වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබුණි.

(ඇ) **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

සමාලෝචිත වර්ෂය සඳහා කසළ කළමනාකරණය වෙනුවෙන් සභාව විසින් රු.33,110,818 ක වියදමක් දරා තිබූ අතර , එකී වියදම් පියවා ගැනීමට හෝ අවම කර ගැනිම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. කසළ පිරිවැය අවම කර ගැනීම සඳහා කසළ බදු පැනවීමක් සිදුකර නොතිබුණි.

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා නව ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 ජුලි 10 දින වන විටත් සකස් කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පරිසර බලපත්‍රයේ වලංගු කාලය අවසන් වී ඇතත් ඒවා අළුත් කිරීමට කටයුතු නොකළ ආයතන 03 ක් තිබූ අතර එකී ආයතන පරිසර බලපත්‍ර ලබා ගැනිමකින් තොරව ව්‍යාපාර කටයුතු කරන බව නිරීක්ෂණය විය.

3:3 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු

(i) 2018 සැප්තැම්බර් 03 දිනට සභා කාර්ය මණ්ඩලයේ ගණකාධිකාරී තනතුරක, කළමනාකරණ සහකාර තනතුරු දෙකක, ආදායම් පරීක්ෂක තනතුරු තුනක , වැඩ පරීක්ෂක තනතුරක, රියදුරු තනතුරු තුනක, වඩු කාර්මික තනතුරක, විදුලි කාර්මික තනතුරක, මුරකරු තනතුරක හා ආරක්ෂක නිලධාරි තනතුරක පුරප්පාඩු පැවතුණි.

(ii) පුරප්පාඩුව පැවති ලේකම් තනතුරේ රාජකාරි ආවරණය කිරීම සඳහා කළමනාකරණ සහකාර පළමු පන්තියේ නිලධාරිනියක පත්කර තිබුණි.

(ආ) සේවක ණය

සේවය හැර ගිය, මියගිය හා විශ්‍රාම ගිය නිලධාරින් 86 දෙනෙකුගෙන් අයවිය යුතු රු.141,127 ක් වූ ණය ශේෂය 2017 දෙසැම්බර් 31 දින වන විටද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වාහන උපයෝජනය

මෝටර්රථ පරීක්ෂක විසින් සිදු කරන ලද වාහන සමීක්ෂණය අනුව අළුත්වැඩියා කිරීමෙන් අනතුරුව ධාවනයට යොදාගත හැකි වාහන 13 ක් හා ධාවනයට නුසුදුසු වාහන 02 ක් හඳුනාගෙන තිබූ නමුත් ඉන් වාහන 03 ක් පමණක් අළුත්වැඩියා කර ධාවනයට යොදවා ගෙන තිබූ අතර, ධාවනයට නුසුදුසු වාහන 02 අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5 හඳුනාගත් පාඩු

සේවා නියුක්ති භාර අරමුදලට වාර්ෂික වාර්තා ප්‍රමාද කර යැවීම හේතුවෙන් අධිභාර ලෙස රු.29,894 ක් ගෙවීමට සිදු වී තිබුණි.

3.6 ප්‍රසම්පාදනය

3.6.1 සැපයීම් හා සේවා

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලිපිද්‍රව්‍ය හා අනෙකුත් සැපයුම් හා උපකරණ මිළදී ගැනීම සඳහා 2016 ඔක්තොබර් 18 දිනැති පුවත්පත් දැන්වීම මගින් සැපයුම්කරුවන් ලියාපදිංචි කරගෙන තිබුණි. එම පුවත්පත් දැන්වීමේ 04 වන ඡේදයට අනුව සියළුම සැපයුම්, නගරසභා බල ප්‍රදේශය තුල නියම කරනු ලබන ස්ථානයට ගෙනවිත් බාර දියයුතු බව අවධාරණය කර තිබුණත් එසේ නොකර සැපයුම්කරු වෙතට නගර සභා නිලධාරියෙකු ගොස් භාණ්ඩ මිළදී ගැනීම සිදු කර තිබීම හේතුවෙන් ඒ සඳහා ප්‍රවාහනය, ඉන්ධන හා නිලධාරින් හට අතිකාල දීමනා ගෙවීම සඳහා භාණ්ඩ වල පිරිවැයට වඩා අමතර පිරිවැයක් ආයතනයට දැරීමට සිදු වී තිබුණි.

[

3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය

පුස්තකාල ගොඩනැගිල්ලේ ටයිල් ඇතිරීම

ඉහත ව්‍යාපෘතිය සඳහා ලංසුව පිරිනමන ලද මුදල රු.517,974 ක් වුවත් අවසන් බිල්පත්‍රය අනුව රු.573,622 ක් ගෙවීම නිසා රු.55,648 ක් වැඩිපුර ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතියේ අංක 02 , 03 හා 04 යන වැඩ විෂයන්වල අවසන් බිල් පත්‍රය අනුව වටිනාකම පිළිවෙලින් සියයට 8.6, 540 හා 267 යන ප්‍රමාණවලින් ඇස්තමේන්තුව ඉක්මවා තිබුණි.

4. **<u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>**

4.1 **<u>අයවැය පාලනය</u>**

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත හා තථ්‍ය ආදායම් වල සියයට 12 සිට සියයට 107 දක්වාත් , වියදම්වල සියයට 17 සිට සියයට 80 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. **<u>පද්ධති හා පාලන</u>**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|
| ---------- | | ------------- |
| (අ) ගිණුම්කරණය | | ලේඛන යාවත්කාලීන නොකිරීම |
| (ආ) ගබඩා පාලනය | i | තොග ශේෂයන් නිවැරදිව ගිණුම්ගත නොවීම |
| | ii | තොග ලේඛන යාවත්කාලීන නොකිරීම |
| (ඇ) අපද්‍රව්‍ය කළමනාකරණය | | විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොවීම |
| (ඈ) අයවැය පාලනය | i | අයවැයගත හා තථ්‍ය ආදායම් අතර විශාල විචලනයන් පැවතීම |
| | ii | අයවැය වියදම හා තථ්‍ය වියදම අතර විශාල විචලනයන් පැවතීම |
| (ඉ) ක්‍රියාකාරී සැලැස්ම | | වර්ෂය තුළ ක්‍රියාත්මක කළයුතු ව්‍යාපෘති ඇතුළත් නොකිරීම |